# මොරවක් කෝරළයේ කිතුල් කර්මාන්ත පිළිබඳ ජනශ්‍රැතික අධ්‍යයනයක්

එම්. ඩී. එස්. උදයංග[1]

ආසියාව නිජබිම කොටගත් කිතුල් ශාකය ලාංකේය ජන ජීවිතය හා සබැඳි වෘක්ෂයකි. කිතුල් ආශ්‍රිත නිෂ්පාදන අද ද දක්නට ඇතත් ඒ සම්බන්ධ ජනශ්‍රැතියක් දැකගැනීම අපහසු ය. එසේ හෙයින් මොරවක් කෝරළය ආශ්‍රිත ව කිතුල් කර්මාන්තය සහ ඒ වටා බැඳුණු ජනශ්‍රැතිය සොයා යාම මේ පර්යේෂණයේ අරමුණ යි. කිතුල් කර්මාන්ත පිළිබඳ ව මීට පෙර පර්යේෂණයක් සිදු කර තිබේ. ඉන්දිකා පතිරණ සහ සුසිලා ලර්දු විසින් සිදු කරන ලද එකී පර්යේෂණයෙන් සොයා යනුයේ කිතුල් කර්මාන්තයේ වර්තමාන තත්ත්වය පිළිබඳ ව පමණි. එසේ හෙයින් කිතුල හා බැඳුණු ජනශ්‍රැතිය සෙවීමේ අටියෙන් මේ පර්යේෂණය සිදු කෙරේ. පර්යේෂණ කාර්යය සිදු කෙරෙනුයේ මොරවක් කෝරළය මූලික කරගෙන යි. පර්යේෂණය සිදු කිරීමේ දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් සම්මුඛ සාකච්ඡා, ක්ෂේත්‍ර අධ්‍යයන යොදාගත් අතර ද්විතීයික මූලාශ්‍ර ලෙස පෙර කරන ලද පර්යේෂණ සහ පොත්පත් යොදාගනු ලැබිණ. ලබාගත් තොරතුරු අනුව පැහැදිලි වූයේ වර්තමානය වන විට කිතුල පිළිබඳ ජනශ්‍රැති කෙමෙන් වියැකී යන බව යි. ඊට හේතු වී ඇත්තේ ආර්ථික වටිනාකම් විනා සංස්කෘතික වටිනාකම් පිළිබඳ ජනතාවගේ ඇති නොදැනුම්වත් භාවයත් කිතුල ආශ්‍රිත ව ජනශ්‍රැතියක් රැකීමට මෙතෙක් කටයුතු නොකරීමත් බව පෙනේ. සමස්තයක් ලෙස කිතුල් කර්මාන්තය හා සබැඳි ජන දිවිය දුෂ්කර වුව ද ඒ වටා අනන්‍ය වූ සමාජ, සංස්කෘතික පරිසරයක් ද පවත්නා බව පැහැදිලි ය.

**ප්‍රමුඛ පද:** මොරවක් කෝරළය, ජනශ්‍රැතිය, කිතුල් කර්මාන්තය, සංස්කෘතික වටිනාකම්

[1] සිංහල අධ්‍යයනාංශය